## ගුරු මවුනි දයාබර

තක්සලාවේ කසුන් තරුව වී
ඔබයි යහමග කියා දුන්නේ
ලොවක සෙනෙහස අපට පුදමින්
ඔබයි දිවියට අරුත දුන්නේ

සඳක් විලසින් පායා ඇවිදින්
උපේ අඳුරු ලොව එළිය කරමින්
ඔවා මිණිමුතු නිබඳ දෙවමින්
ඔබයි අප රැකි පවුර වූයේ

දෙවන මව වී කුළුණු ගුණයෙන්
මිනිස් ගුණදම් පුරුදු කරමින්
අපව අබිසෙක් කරනු රිසියෙන්
ඔබයි අප දුක් දරාගන්නේ

♦ **අජිත් වික්‍රමසිංහ**
**ශ්‍රී සදානන්ද පිරිවෙන**
**පෙරියකුලම Sri Lanka**

## දියකඩිත්ත


දණ්ඩි පැටව් කොරළි පැටව්
දිය රැල්ලේ පීනායයි
ඕලු නෙළුම් නිල් මහනෙල්
වතුරේ පිපිලා හිනැහෙයි
පිළිහුඩුහාමී ඉඳගෙන
මාළුවන්ට මාන බලයි
ඕලු කොළය උඩ ඉඳගෙන
ගෙඹිහාමී සිනා නගයි

වක්කඩ ළඟ සුදු ඇඳගෙන
කොක්හාමී සිල් අරගෙන
දිය හබරල කෙකටිය මල්
මඳ පවනේ සුළඟෙ වැනෙයි

♦ **දුමිණි වික්‍රමාරච්චි**
**බණ්ඩාරවත්ත පරාක්‍රම**
**මහවිදුහල ගම්පහ Sri lanka**

## ධම්මපදය

**ගොනා මසින් වැඩෙයි, ලෙයින් වැඩෙයි, එහෙත් නුවණින් නොවැඩෙයි. මෝඩයාද එවැනිය. ඔහුගේ සිරුරේ මස් ලේ වැඩෙන නමුත් නුවණ වැඩෙන්නේ නැත.**




**Children's Corner**

## Superstition මිත්‍යා විශ්වාස

Most superstitions go back many thousands years to the dayswhaen early man lived in ignorance, in a world that frightened him. He believed that living spirits caused alarming happenings. He thought he got to be careful.

When you go into a shoe shop, you will notice that the assistant almost always takes out the right shoe first. If you ask why, he would tell you that he was trained that way. In fact, this is relic of the old superstition that it is unlucky to put on the left shoe before the right.

මිනිසා නුවණින් අඩුව, ඉතා බියපත්ව විසූ වසර දහස් ගණනක් ඈත කාලයේ සිට මේ දක්වාම ලෝකයේ පැවත එන දෙයකි, මිත්‍යා හෙවත් බොරු විශ්වාස. අවට භූතාත්ම ඇතැයිද, ඒවා තමාට හානි පමුණුවනු ඇතැයිද මිනිසා සිතුවේය. ඔබ සපත්තු කඩයකට ගියවිට සාප්පුකරු දකුණු සපත්තු කකුල මුලින් එළියට ගනී. ඒ ඇයිදැයි ඇසුවොත් මගේ ලොක්කා මා පුරුදු කළේ ඒ විදියටයි යනුවෙන් කියනු ඇත. එහෙත් එය පැරණි මිත්‍යා විශ්වාසයකින් ඉතුරුව ඇති සිරිතකි.

♦ ***Auntie Ramani* - රමණී නැන්දා**

## දුරු රට ගිය අම්මාට

සතුට සොයාගෙන එන්න
දුරු රටකට ගිහින් ඔබ
කඳුළු දහදිය සමග
පොරබදනවාලු නිබඳවම
ඔබ නොමැති ලෝකයක
කෙලෙසක සතුට ලබන්නද
ඔබ සිටී නම් අපට
රන් කහවණු කුමට

♦ **සාලිය ලක්මාල්කුමාර**
**ශ්‍රී සුදර්ශණ දහම් පාසැල**
**අංගමුව රාජාංගනය**

## විරුවෙක් වූ අයියාට

මලක් තබා බුදුන් පුදමි
මගෙ රට බේරාදෙන්නට
දෝත නගා සිරස නමමි
ශක්තිය තව වැඩිවන්නට
හැමදා ආදරය කරමි
බියගුළුකම නැතිවුනාට
සදාකල්ම දිරි දෙන්නෙමි
විරුවෙක් වූ මගෙ අයියට

♦ **ගීතාංජලී දිසානායක**
**ශ්‍රී රාහුල ම විද්‍යාලය**
**කොටුගොඩ Sri Lanka**

**BOC**

**ලංකා බැංකුව**
**BANK OF CEYLON**

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලන්ඩන් ශාඛාව**

**වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.**

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC ගිණුමක් අරඹන්න !**
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගත-කර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**



# පිනිමුතුසර
## සැඳෑ ගී ප්‍රසංගය

**එ**ක්සත් රාජධානියේ සරේ ප්‍රාන්තයේ කිංස්ටන් විශ්වවිද්‍යාල යේ ශාස්ත්‍ර හදාරණ ශ්‍රීලාංකික තරුණ ශිෂ්‍ය පිරිසක් සංවිධානය කළ **පිනිමුතුසර** නම් වාර්ෂික ගීත ප්‍රසංගය තුන්වන වරටද ගිය පෙබරවාරි මස 19 වෙනි බ්‍රහස්ප තින්දා සන්ධ්‍යා සමයේ කිංස්ටන් හි Performing Art Centre නම් රංග ශාලාවේ ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවතියේ ය. චින්තක ගුණසේකර නම් සංගීත ශිල්පි යාගේ මූලිකත්වයෙන් යුතුව ආසිරි බණ්ඩාර සහ ඉන්දුසර රණසිංහ මෙම ප්‍රසංගය සංවිධානය කර තිබිණ. ලන්ඩනයේ ලංකාවිත්ති සිංහළ පත්‍රයේ කර්තෘවර දයා ආනන්ද රණසිංහ මහතා මෙහි විශේෂ ආරාධිත අමුත්තා වීය.

මෙම පිනිමුතු ගීත ප්‍රසංගයේ විශේෂත්වයක් වූයේ සාමාන්‍ය ප්‍රසංග වේදිකාවේ සියළු භාණ්ඩ විද්‍යුත් ක්‍රම මගින් පණපොවා විශාල හඬ විහිදවමින් කරන වාදනයන් නැතිව සාමාන්‍ය වූ එහෙත් ශාලාවක රැස්ව සිටින ශ්‍රාවකයින්ට ඇසෙන ප්‍රමාණයට සංගීත භාණ්ඩ වාදනය කරමින් ගී ගැයීමය. සංවිධායකවරු මෙය හැඳින්වූයේ An un-plugged music secession යනුවෙනි.

චින්තක ගුණසේකර (Keyboard) සචිත් පීරිස් (Lead Guitar) අමල් චන්ද්‍රසේන (Rhythm Guitar) ඉන්දුසර රණසිංහ (Acoustic Drums) අචින්ත මෙන්ඩිස් (Percussion) සංගීතය සැපයූ වාදක මණ්ඩලයයි. ආසිරි බණ්ඩාර ප්‍රසන්න වූ වාග්මාලාවකින් ප්‍රසංගයේ ශිල්පීන් හඳුන්වාදෙමින් විස්තර කථනය කළේ ය.

පිනිමුතු ප්‍රසංගයේ මෙවර විශේෂත්වයක් වූයේ ශ්‍රීලංකාවේ නුදුරු අතීතයේ ජනප්‍රිය ශිල්පීන් වන සීටී ප්‍රනාන්දු, ජේ. ඒ. මිල්ටන් පෙරේරා, එච්. ආර්. ජෝතිපාල, ක්ලැරන්ස් විජේවර්ධන ආදී කලා කරුවන්ගේ ගායනා මෙදින ගායකයින් විසින් ගයනු ලැබීමයි. එය ශ්‍රාවකයින්ගේ ඉමහත් ප්‍රසාද යට හේතුවූ බැව් පෙණින.

ආරාධිත ගායකයින් දෙදෙන වන දිමුතු තිලකරත්න සහ ජගත් ජයතිලක සිය සුපුරුදු ගායනා විලාශයෙන් ශ්‍රාවක සිත් පබුදු කළෝය. මිලින්ද සුභාෂණ, ශ්‍යාමා කළුආරච්චි සහ සුනීතා පෙරේරා එදින එම සොබමන් සැඳෑවට නව පණක් එක්කළ බව ඉතා සතුටින් මෙසේ සටහන් කරනු කැමැත්තෙමි.

**කීර්ති**



**ප්‍රසංග සංවිධායක චින්තක ගුණසේකර සරපුවරුව වයමින්**

එංගලන්තයේ එකම සජීවී සිංහළ ගුවන්විදුලිය
**ලක් සවන**
**92 FM** තරංගමාලා ඔස්සේ දැන් ඔබට සවන්දිය හැක. සෑම ඉරිදාවකම සවස 4 - 5 දක්වා **East London** යේ සිට විකාශනය කෙරේ. ශ්‍රීලංකාවේ වත්මන් තත්වය පිළිබඳ උණුසුම් පුවත් සංස්කෘතික තොරතුරු ඔබ කැමති ගීත ආදී විශේෂාංග ඇතුළත් විවිධ වැඩසටහන්. මෙය පහත සඳහන් වෙබ් අඩවියෙන් ද ඇසිය හැක.
**www.nusoundradio.com**
විස්තර සඳහා විමසන්න - ආසිරි බණ්ඩාර **07894791159**
සෙව්වන්දි දිසානායක **07950134124**





**කථනය ආසිරි බණ්ඩාර**



***Photographs:* Aravinda Bomiriyage**